**ශීර්ෂය 128 - සාම්ප්‍රදායික කර්මාන්ත හා කුඩා ව්‍යවසාය සංවර්ධන අමාත්‍යාංශය පිළිබඳ විගණකාධිපති වාර්තාව 2014 වර්ෂය**

---

මෙම වාර්තාවේ 1 ඡේදයේ සිට 2 ඡේදය දක්වා අමාත්‍යාංශයේ ගිණුම් පිළිබඳ පොදු තොරතුරු ඇතුළත් කර ඇති අතර 3 ඡේදයේ සිට ශීර්ෂයට අදාල විගණන නිරීක්ෂණ දැක්වේ.

1.1 **විගණන විෂය පථය**

---

සාම්ප්‍රදායික කර්මාන්ත හා කුඩා ව්‍යවසාය සංවර්ධන අමාත්‍යාංශයේ 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, සැසඳුම් ප්‍රකාශන, පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2015 අගෝස්තු 03 දින අමාත්‍යාංශයේ ලේකම් වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

**1.2** **ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාගේ වගකීම**

---

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148,149,150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වාගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වා ගෙනයාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

## 2. ගිණුම්

-------

### 2.1 විසර්ජන ගිණුම්

------------------

**මුළු ප්‍රතිපාදනය හා වියදම**

------------------------------

අමාත්‍යාංශය සඳහා සළසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු. මිලියන 1,130.94 වූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු. මිලියන 1,116.89 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු. මිලියන 14.05 ක් හෙවත් සියයට 1 ක ප්‍රමාණයක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි. විස්තර පහත දැක්වේ.

| වියදම | 2014 දෙසැම්බර් 31 දිනට | | | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| | ශුද්ධ ප්‍රතිපාදනය | උපයෝජනය | ඉතිරිය | |
| | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | |
| පුනරාවර්තන | 699.54 | 698.88 | 0.66 | 0.09 |
| මූලධන | 431.40 | 418.01 | 13.39 | 3.10 |
| **එකතුව** | **1,130.94** | **1,116.89** | **14.05** | **1.24** |

### 2.2 අත්තිකාරම් ගිණුම

-------------------

**රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම**

--------------------------------------

**පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්**

---------------------------------------------

අමාත්‍යාංශයට අදාල රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම් වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ.

| විෂය අංකය | වියදම | | ලැබීම් | | හර ශේෂය | |
|---|---|---|---|---|---|---|
| | උපරිම සීමාව | තථ්‍ය | අවම සීමාව | තථ්‍ය | උපරිම සීමාව | තථ්‍ය |
| | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන |
| 12801 | 7.50 | 5.19 | 2.50 | 3.68 | 25.00 | 13.25 |

**2.3 අග්‍රිම ගිණුම**

අමාත්‍යාංශයේ 2014 දෙසැම්බර් 31 දිනට අග්‍රිම ගිණුමේ ශේෂය රු.1,708,659ක් විය. 2015 අප්‍රේල් 30 දින වන විට ද අමාත්‍යාංශය විසින් එම ශේෂයෙන් රු.810,130 ක් පියවා නොතිබුණි.

**2.4 පොදු තැන්පත් ගිණුම**

අමාත්‍යාංශයේ 2014 දෙසැම්බර් 31 දිනට පොදු තැන්පත් ගිණුමේ ශේෂවල එකතුව රු.2,594,283ක් විය.

**2.5 විගණන නිරීක්ෂණය**

2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය වාර්තා හා පොත් අනුව සාම්ප්‍රදායික කර්මාන්ත හා කුඩා ව්‍යවසාය සංවර්ධන අමාත්‍යාංශයේ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන 1.1 ඡේදයේ දක්වා ඇති කළමනාකරණ විගණන වාර්තාවේ සඳහන් නිරීක්ෂණවලට යටත්ව සතුටුදායක ලෙස පිළියෙල කර තිබුණි. එම කළමනාකරණ විගණන වාර්තාවේ ඇතුළත් නිරික්ෂණවලින් ප්‍රමාණාත්මක හා වැදගත් නිරීක්ෂණ 3 ඡේදයේ දක්වා ඇත.

**3. ශීර්ෂය 128 - සාම්ප්‍රදායික කර්මාන්ත හා කුඩා ව්‍යවසාය සංවර්ධන අමාත්‍යාංශය**

**3.1 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම**

අමාත්‍යාංශය විසින් 2002 නොවැම්බර් 28 දිනැති අංක අයිඒඅයි/2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය ප්‍රකාරව පරිගණක, උපාංග හා මෘදුකාංග පිළිබඳ ස්ථාවර වත්කම් ලේඛනය පවත්වා නොතිබුණි. 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය ප්‍රකාරව ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කර නොතිබුණි.

**3.2 විසර්ජන ගිණුම**

**3.2.1 අයවැය විචලනය**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) වැය විෂයයන් 01ක් සඳහා සළසා තිබුණු රු.598,030ක ශුද්ධ ප්‍රතිපාදනය මුළුමණින්ම ඉතිරි වී තිබුණි.

(ආ) වැය විෂයයන් 10 ක් සඳහා අධිප්‍රතිපාදන සළසා තිබීම හේතුවෙන් ප්‍රතිපාදන උපයෝජනය කිරීමෙන් පසු ඉතිරිය එම වැය විෂයයන්ට අදාළ ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 10 ක සිට සියයට 99 ක් දක්වා පරාසයක ප්‍රමාණයක් ගෙන තිබුණි.

**3.3 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය**

විෂය අංක 12801 දරන අත්තිකාරම් ගිණුම පිළිබඳ 2014 දෙසැම්බර් 31 දිනට සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව එදිනට අයවීම් හිඟහිට තිබුණු ශේෂවල එකතුව රු.481,969 ක් වූ අතර, එම හිඟහිටි ශේෂ වර්ෂ 01 ක සිට වර්ෂ 05 ක් දක්වා කාල පරාසයක සිට පැවැත එමින් තිබුණත්, එම හිඟ හිටි ශේෂ අයකර ගැනීමට අමාත්‍යාංශය අපොහොසත් වී තිබුණි. විස්තර පහත දැක්වේ.

**3.4 යහපාලනය හා ගිණුම් කටයුතුභාවය**

**3.4.1 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම**

2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව අමාත්‍යාංශය විසින් ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කර නොතිබුණි.

**3.4.2 අභ්‍යන්තර විගණනය**

අමාත්‍යාංශය විසින් අභ්‍යන්තර විගණන ඒකකයක් ස්ථාපිත කර තිබුණද එහි පහත අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) ප්‍රධාන අභ්‍යන්තර විගණක තනතුර 2011 මැයි 08 දින සිට 2015 මැයි 31 දින දක්වා වර්ෂ 04 කට අධික කාලයක් මුළුල්ලේ පුරප්පාඩුව පැවැතුණි.

(ආ) මුදල් රෙගුලාසි 134(3) ප්‍රකාරව අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණු අතර 2009 ජුනි 09 දිනැති අංක DMA/2009(1) දරන විගණන හා කළමනාකරණ චක්‍රලේඛයේ මඟපෙන්වීම්වලට අනුකූලව අභ්‍යන්තර විගණනය සිදුකර නොතිබුණි.

**3.5 වත්කම් කළමනාකරණය**

**(අ) වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ පැවැත්වීම**

2014 ඔක්තෝබර් 17 දිනැති අංක 02/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව 2014 වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය සිදුකර එම වාර්තා 2015 මාර්තු 17 දිනට ප්‍රථම විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත්, අමාත්‍යාංශය විසින් 2015 දෙසැම්බර් 31

දින වන විටත් එම වාර්තා විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණි. අවසාන වශයෙන් වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය 2013 වර්ෂය වෙනුවෙන් පවත්වා තිබුණි.

**(ආ) බාහිර පාර්ශවයන් වෙත දී ඇති වත්කම්**

අමාත්‍යාංශය විසින් ඇතැම් වත්කම් අවිධිමත් ලෙස බාහිර පාර්ශවයන් වෙත මුදාහැර තිබුණු අවස්ථා පහත පරිදි නිරීක්ෂණය විය.

| වත්කම් වර්ගය | ලබාදී ඇති ආයතනය | වටිනාකම | කාල පරිච්ඡේදය |
|---|---|---|---|
| | | රු. | |
| ගොඩනැගිලි<br>වෙනත් වත්කම් | සමූපකාර හා වෙළඳ කටයුතු අමාත්‍යාංශය | තක්සේරු කර නොමැත | 2013 සිට 2015.01.08 දක්වා |
| වාහනය | නෝත්සී ආයතනය - වීරවිල | එම | 2012.09.17 |
| වාහනය | නෝත්සී ආයතනය - ලුනුවිල | එම | 2012.06.13 |
| වාහනය | ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය - මොණරාගල | එම | 2013.08.06 |
| වාහනය | ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය - රත්නපුර | එම | 2013.09.30 |
| වාහනය | තල් සංවර්ධන මණ්ඩලය | එම | - |

**3.6 අනුකූල නොවීම්**

**නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

සමාලෝචිත වර්ෂය අවසාන වන විට අයකර ගැනීමට හෝ කපා හැරීමට තිබුණු රු.337,803 ක අලාභහානි සම්බන්ධයෙන් 2015 මාර්තු 31 දින වන විටත් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

**3.7 දේශීය මූල්‍යකරණ මඟින් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම**

**ව්‍යාපෘති ආරම්භ නොකර අතහැර දැමීම**

අමාත්‍යාංශය විසින් පහත සඳහන් ව්‍යාපෘති ආරම්භ නොකර අත්හැර දමා තිබුණි.

(අ) හම්බන්තොට මැදමුලන කොහු ආශ්‍රිත නිෂ්පාදන ගම්මානය සංවර්ධනය කිරීමට රු.මිලියන 2.1 ක ඇස්තමේන්තුවක් මත සැලැසුම් කර තිබුණද, පහසුකම් මදකම නිසා එම ව්‍යාපෘතිය අත්හැර තිබුණි.

(ආ) ගාල්ල, හබරාදූව, වැල්ලද්දරගොඩ කොහු ආශ්‍රිත නිෂ්පාදන ගම්මානය රු.මිලියන 9 ක ඇස්තමේන්තුවක් යටතේ සංවර්ධනය කිරීමට සැලැසුම් කර තිබුණද, ප්‍රමාණවත් ප්‍රතිලාභීන් සංඛ්‍යාවක් නොමැති වී නිසා එම ව්‍යාපෘතිය අත්හැර තිබුණි.

(ඇ) කොළඹ, පනාලුව කාර්මික ජනපදයේ අභ්‍යන්තර පාරවල් හා කාණු අළුත්වැඩියා කිරීම සහ ආරක්ෂිත පවුරක් ඉදි කිරීම සඳහා සමාලෝචිත වර්ෂයේදී රු.මිලියන 2 ක ප්‍රතිපාදන සළසා තිබුණද එම ඉදිකිරීම ආරම්භකර නොතිබුණි.

.

(ඈ) රත්නපුර, පුස්සැල්ල කාර්මික ජනපදය හා මාතලේ කාළුදැවල කාර්මික ජනපදය වටා වැටක් ඉදිකිරීම සඳහා පිළිවෙලින් රු.500,000 ක් හා රු.700,000 ක ප්‍රතිපාදන සළසා තිබුණද, එම ඉදිකිරීම ආරම්භකර නොතිබුණි.

(ඉ) නුවරඑළිය, කොටගල කාර්මික ජනපදය සඳහා රු.700,000 ක වියදමින් ආරක්ෂක කුටියක් ඉදිකිරීමට සැලැසුම් කර තිබුණද, එම කුටිය ඉදිකිරීමට කටයුතු කර නොතිබුණි.

**3.8 කාර්යසාධනය**

2014 වාර්ෂික අයවැය ඇස්තමේන්තුව හා ක්‍රියාකාරී සැලැස්ම අනුව අමාත්‍යාංශයේ ප්‍රගතිය පිළිබඳ පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) **ප්‍රධාන කාර්යයන්ට පටහැනි ක්‍රියාකාරකම්**

**------------------------------------------------**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) හම්බන්තොට, බෙලිඅත්ත, අඟුල්මඩුව ලාක්ෂා නිෂ්පාදන ගම්මානයේ හඳුනාගත් ප්‍රතිලාභීන් 40 දෙනෙකු සඳහා උපකරණ, අමුද්‍රව්‍ය, යටිතල පහසුකම් හා පුහුණු වැඩසටහන් පැවැත්වීම වෙනුවෙන් රු.මිලියන 2 ක ප්‍රතිපාදන සළසා තිබුණු අතර ඒ සඳහා රු.532,670 ක් වැය කර තිබුණි. වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම තුළ අන්තර්ගත නොවූ මෙම ක්‍රියාකාරකම සමාලෝචිත වර්ෂය අවසාන වන විට සියයට 27 ක ප්‍රගතියක් ලබා ගෙන තිබුණි.

(ii) මහනුවර නීලවල ස්වර්ණාභරණ නිෂ්පාදන ගම්මානයේ ප්‍රතිලාභීන් සඳහා ඉදිකර තිබූ පොදු පහසුකම් මධ්‍යස්ථානය තුළ වර්ග අඩි 120 ක් පමණ බිම් ප්‍රමාණයක් කිසිදු අනුමැතියකින් හා ගෙවීම් කිරීමකින් තොරව ග්‍රාම නිලධාරීවරයෙකු විසින් උපයෝජනය කරමින් තිබූණු බව නිරීක්ෂණය විය.

(ආ) **ප්‍රමාණවත් ලෙස ඉටුනොකල ප්‍රධාන කාර්යයන්**

**---------------------------------------------------**

අමාත්‍යාංශයේ ප්‍රධාන කාර්යයන් ප්‍රමාණවත් ලෙස ඉටු කර නොතිබුණු අතර එසේ නිරීක්ෂණය වූ අවස්ථා කිහිපයක් පහත දැක්වේ.

(i) මහනුවර කලාසිරිගම හණ ආශ්‍රිත නිෂ්පාදන ගම්මානයේ පොදු පහසුකම් මධ්‍යස්ථානය පැවති ඉඩම නීත්‍යානුකූලව පවරා නොගැනීම නිසා එම ඉඩම වටා රු.800,000 ක් වැයකරමින් ඉදිකිරීමට යෝජිත ආරක්ෂිත වැට සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් ඉදිකිරීමට පියවර ගෙන නොතිබුණි.

(ii) ගම්පහ අත්තනගල්ල අලවල සංගීත භාණ්ඩ නිෂ්පාදන ගම්මානයේ වැඩමඩු 20 ක් සඳහා යටිතල පහසුකම් සංවර්ධනය යටතේ විදුලි බලය සැපයීම සඳහා රු.580,000 ක ඇස්තමේන්තුවක් සකස් කර තිබුණද සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් අදාල කටයුත්ත සම්පූර්ණ කිරීමට පියවරගෙන නොතිබුණි.

(iii) මිනුවන්ගොඩ පොල්වත්ත මැටි ගම්මානයේ ප්‍රතිලාභීන් සඳහා ජංගම මැටි අඹරණ යන්ත්‍රයක් 2014 මැයි මාසය වන විට ලබාදීමට සැලැසුම් කර තිබුණි. යන්ත්‍රයේ නිෂ්පාදන කටයුතු සඳහා රු.1,145,005 ක වියදමක් කර තිබුණද, සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් එම යන්ත්‍රය ප්‍රතිලාභීන් වෙත ලබාදීමට කටයුතු කර නොතිබුණි.

**(ඇ) සැලැසුම් කිරීම**

**----------------**

2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2004 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව පිළියෙල කර තිබුණු ක්‍රියාකාරි සැලැස්ම අනුව කටුයුතු කර නොතිබු අවස්ථා කිහිපයක් පහත දැක්වේ.

**(i) හස්ත කර්මාන්ත ගම්මාන සංවර්ධනය**

**---------------------------------------**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

* හස්ත කර්මාන්ත ගම්මාන ව්‍යාපෘති 05 ක් ආරම්භ කිරීම සඳහා අපේක්ෂිත පිරිවැය රු.150,000 ක් වුවද, ඒ සඳහා රු.1,917,190 ක් වැය කර තිබුණි.
* හස්ත කර්මාන්ත ගම්මාන ව්‍යාපෘති 22 ක් අධීක්ෂණය, සම්බන්ධීකරණය හා ඇගයිම සඳහා වියදම රු.මිලියන 1 ක් ඇස්තමේන්තු කර තිබුණද, ඒ සඳහා රු.2,630,609 ක් වැය කර තිබුණි. මේ අනුව අපේක්ෂිත පිරිවැය සියයට 163 කින් ඉක්මවා තිබුණි.

**(ii) මැටි ගම්මාන සංවර්ධනය**

**--------------------------**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

* උඩුබද්දාව මඩවලාගාරය ගම්මානයේ ශිල්පීන් සඳහා දර පෝරනු 59 ක් සැපයිම සඳහා රු.මිලියන 1.2 ක් ඇස්තමේන්තුගත කර තිබුණද, ප්‍රධාන කාර්යාලයේ සංවර්ධන කටයුතු සඳහා පසුව එම මුදල් යොදා ගෙන තිබුණි.
* නාඋල දොඩම්අත්තාවල ප්‍රතිලාභීන් 20 ක් සඳහා වැඩමඩු ලබාදීම වෙනුවෙන් රු.මිලියන 1.2 ක් ඉලක්ක කර තිබුණද, සමාලෝචිත වර්ෂය අවසාන වන විට වැඩමඩු ප්‍රමාණය 10 ක් දක්වා අඩුකර ලබා දී තිබුණි.
* 2014 ජුනි මාසය වන විට කඩුවෙල රනාල වැඩමඩු 10 ක් ඉදිකිරීම අවසන් කිරීමට සැලැසුම් කර තිබුණද, සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් එම වැඩමඩු අවසන් කර නොතිබුණි.

**(iii) කිතුල් සංවර්ධන ජාතික වැඩසටහන**

**------------------------------------**

**පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.**

* ගස් නැගීමේදී සිදුවන හදිසි අනතුරුවලින් ඇති වන ආපදාවන් සඳහා වන්දි ලබා දීමේ පියවරක් වශයෙන් කිතුල් කාර්මිකයන් 1,000 ක් සඳහා රක්ෂණ

ක්‍රමයක් හඳුන්වා දී තිබුණි. එම කිතුල් කාර්මිකයින් අතරින් 113 දෙනෙකු පමණක් රක්ෂණය වී තිබුණි. මේ අනුව එම වැඩසටහනේ අපේක්ෂිත අරමුණෙන් සියයට 11 ක් පමණ ක් සාර්ථක වී තිබුණි.

* කිතුල් නිෂ්පාදන ගම්මාන හතරක් නැවත ක්‍රියාත්මක කරවීම සඳහා සමාලෝචිත වර්ෂයේදී රු.150,000 ක ප්‍රතිපාදන සළසා තිබුණත්, එය සමාලෝචිත වර්ෂයේදී ක්‍රියාත්මක කර නොතිබුණි. එම ගම්මාන නැවත ක්‍රියාත්මක කිරීමටද කටයුතු කර නොතිබුණි.
* කොළඹ දිස්ත්‍රික්කයේ රු.500,000 ක වියදමින් කිතුල් පැළ තවාන් 05 ක් ඇති කිරීමට සැලසුම් කර තිබුණද, සුදුසු ස්ථානයක් සොයා ගැනීමට අපහසු වීම හේතුවෙන් කිසිදු කිතුල් පැළ තවානක් ඇතිකර නොතිබුණි. වෙනත් දිස්ත්‍රික්කයක හෝ පැළ තවාන් ඇති කිරීමට සුදුසු ස්ථානයක් සොයා ගැනීමට කටයුතු කර නොතිබුණි.
* සමාලෝචිත වර්ෂයේදී කිතුල් පැළ 20,000 ක් තෝරාගත් ගොවීන් වෙත බෙදා හැරීමට සැලැසුම් කර තිබුණද, වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව සමඟ මේ පිළිබඳ එකඟතාවයකට නොපැමිණීම හේතුවෙන් පැළ 1,025 ක් පමණක් බෙදාහැර තිබුණි.
* ආරක්ෂිත පටි සහ පිහි 1,000 ක් කිතුල් කර්මාන්තකරුවන් වෙත ලබාදීම සඳහා රු.මිලියන 4.5 ක් ඇස්තමේන්තු කර තිබුණද, සමාලෝචිත වර්ෂයේදී රු.මිලියන 4.73 ක් වැයකර ආරක්ෂිත පටි සහ පිහි 476 ක් පමණක් ලබාදී තිබුණි.
* සමාලෝචිත වර්ෂයේදී කිතුල් කර්මාන්තකරුවන් 10 දෙනෙකුගේ නිෂ්පාදන සඳහා ශ්‍රී ලංකා තත්ත්ව සහතිකය (SLS) ලබාදීමට රු.500,000 ක ඇස්තමේන්තුවක් සකස් කර තිබුණද, එක් කිතුල් කර්මාන්තකරුවෙකුට හෝ තත්ත්ව සහතිකය ලබාදීමට කටයුතු කර නොතිබුණි.

**(iv) කාර්මික ජනපද**

----------------

ප්‍රධාන හා කුඩා කාර්මික ජනපද ප්‍රවර්ධනය හා නවීකරණ ව්‍යාපෘතිය මඟින් ප්‍රධාන කාර්මික ජනපද 05 ක හා කුඩා කාර්මික ජනපද 08 ක යටිතල පහසුකම් සංවර්ධනය යටතේ කළුඇවල මාතලේ කුඩා කාර්මික ජනපදයේ අභ්‍යන්තර මාර්ග පද්ධතිය අළුත්වැඩියාව සඳහා රු.මිලියන 4.7 ක ප්‍රතිපාදන සළසා තිබුණි.

සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් සියයට 40 ක් වැනි පහළ මට්ටමක ප්‍රගතියක් වාර්තා කර තිබුණි.

**3.9 මූල්‍ය අක්‍රමිකතා සවරූපයේ ගනුදෙනු**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) උතුරු පළාතේ තල් ආශ්‍රිත නිෂ්පාදන මත යැපෙන පවුල් 70,000 කගේ ජීවනෝපාය සංවර්ධනය කිරීමේ කටයුතු කඩිනම් කිරීම වෙනුවෙන් තල් සංවර්ධන මණ්ඩලයට රු.6,000,000 ක අත්තිකාරම් මුදලක් ලබාදී තිබුණි. ඉන් පුහුණු වැඩසටහන් පැවැත්වීම, හෝටල් ගාස්තු ගෙවීම, ප්‍රවාහනය සඳහා ඉන්ධන ලබාදීම, තල් අතු මිලදී ගැනීම වෙනුවෙන් ව්‍යාජ ලෙස සකස් කර තිබූ වවුචර්, බිල්පත්, කුවිතාන්සි, ලිපි ලේඛන හා ව්‍යාජ අත්සන් පදනම් කර ගෙන රු.593,108 ක ගෙවීම් පියවා තිබුණි. ඒ අනුව තල් සංවර්ධන ව්‍යාපෘතිය යටතේ තල් සංවර්ධන මණ්ඩලයට ලබාදෙන ලද රු.6,000,000 ක මුදල උතුරු පළාතේ තල් ආශ්‍රිත නිෂ්පාදන මත යැපෙන පවුල් 70,000 කගේ ජීවනෝපාය සංවර්ධනය කිරීමේ කටයුත්ත සඳහා උපයෝජනය කර තිබුණු බව විගණනයේදී තහවුරු කර ගැනිමට නොහැකි විය.

(ආ) ඉහත සඳහන් කූඨ ලේඛන සකස් කිරීම, අත්සන් ව්‍යාජ ලෙස යෙදීම, සාවද්‍ය බිල්පත් ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 103 (1) (ආ) ප්‍රකාරව පොලිසියට පැමිණිලි කර නොතිබුණි.

**3.10 මානව සම්පත් කළමනාකරණය**

**(අ) අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව**

2014 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදී විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 19 | 12 | 07 |
| (ii) | තෘතියික මට්ටම | 04 | 02 | 02 |
| (iii) | ද්විතියික මට්ටම | 398 | 314 | 84 |
| (iv) | ප්‍රාථමික මට්ටම | 32 | 24 | 08 |
| | **එකතුව** | **453** | **352** | **101** |

**(ආ) අවිධිමත් ලෙස වෙනත් පාර්ශවයන්ට නිදහස් කල මානව සම්පත්**

**-------------------------------------------------------------------**

අමාත්‍යාංශය විසින් සමාලෝචිත වර්ෂයේදී වෙනත් පාර්ශවයන්ට අවිධිමත් ලෙස මුදාහැර තිබුණු මානව සම්පත් පිළිබඳ විස්තරයක් පහත දැක්වේ.

| **සේවක වර්ගය** | **සංඛ්‍යාව** | **වෙනත් පාර්ශවය** | **මුදාහැර තිබුණු කාල පරිච්ඡේදය** |
|---|---|---|---|
| සංවර්ධන සහකාර | 01 | ජාතික ශිල්ප සභාවට | 2012 ඔක්තෝබර් |

**(ඇ) වෙනත් පාර්ශවයන්ගෙන් ලබාගත් මානව සම්පත්**

**--------------------------------------------------**

අමාත්‍යාංශය විසින් රාජ්‍ය ආයතනයක ප්‍රධාන කාර්යාලයට අනුයුක්තව සිටි රියදුරෙකු 2011 අප්‍රේල් මාසයේ සිට 2015 ජනවාරි 09 දින දක්වා වර්ෂ 03 කට අධික කාලයක් මුළුල්ලේ අවිධිමත් ලෙස සේවයේ යොදවාගෙන තිබුණි.